07. 06. 2018,

ගෞරවණීය පූජක තුමනි/දේවගැති තුමනි/සභාපාලක තුමනි,

<u>**ශුද්ධ බයිබලය කියවීම සඳහා පුහුණු කොට, බලපත්‍ර ලබා දීම සම්බන්ධ ව**</u>

ඉහත සඳහන් කරුණ පිළිබඳ ව පහදා දීමේ දී අප දේවස්ථානයන්හි ශුද්ධ බයිබලය කියවන බොහෝ දෙනා, ඒ සම්බන්ධ පුහුණුවක් ලබා නොමැත. එබැවින්, සභාවන් සහ දේවස්ථාන කිහිපයකින් ම ශ්‍රී ලංකා බයිබල් සංගමයෙන් ඉල්ලා ඇති පරිදි, ශුද්ධ බයිබලය දේවස්ථානයන්හි නිවැරදි ව කියවීම සඳහා පුහුණු කිරීමට අප විසින් අදහස් කර තිබෙන බැව් අපි සතුටින් දන්වා සිටිමු. තවද එම කාර්යභාරය, ශුද්ධ බයිබලය ප්‍රකාශනය හා බෙදා හැරීමේ කටයුත්තෙහි නියැළී සිටින අපගේ වගකීමක් බව ද දන්වනු කැමැත්තෙමු.

දේව මෙහෙයයන්හි දී ශුද්ධ බයිබලය කියවීම සඳහා වන බලපත්‍ර නිකුත් කිරීම පෙර පටන් තිබූ ක්‍රමවේදයකි. එහෙත් දැනට නැවතී ඇති එම ක්‍රියාවලිය, අප කිතුනු සභා තුළින් නැවත ක්‍රියාත්මක කිරීම අපගේ යුතුකම යි. අප බොහෝ දෙනෙක් සවන් දෙන ජන මාධ්‍ය නාලිකාවලින් අපට ඇසෙන වේග රිද්මයේ වචනාකාරයට ශුද්ධ බයිබලයේ අඩංගු වචන ප්‍රකාශ කිරීම නිවැරදි නොවේ. ඒ පිළිබඳ ව සලකා බැලීමේ දී, දෙවි වදන ප්‍රකාශයට පත් කරන කිතුනුවන් හට මෙය කාලීන අවශ්‍යතාවක් වන්නේය.

ශුද්ධ බයිබලය කියවන්නට නොහැකි අය සඳහා දැනට අප විසින් කිහිප ආකාරයකින් ම ක්‍රියාත්මක වී ඇති අතර සංයුක්ත තැටි (Compact Disks) සඳහා හඬ කැවීම් කළ ප්‍රවීණයින් අතර කිතුනු නො වූවන් ද සිටියහ.

කරුණු එසේ හෙයින්, අපගේ මෙම ක්‍රියාවලියේ අරමුණ වන්නේ, දේව වචනය නියමාකාරයෙන් ජනතාව අතට පත් කිරීමයි. එබැවින් අපගේ දෙවියන් වහන්සේගේ වචනය ව්‍යක්ත කිරීමට, හැකියාවන් ලබා ඇති ඔබ සැමගේ ම කට හඬින් එය ජන ගත කිරීමේ වගකීම දරමින් අප කරන්නා වූ මෙම කාර්යයට සහභාගි වන්නට අපගේ ඇරැයුම් ඔබට යි.

ඔබ දේවස්ථානයේ ඉරු දින දේව මෙහෙයයේ දී මෙය ජනතාව වෙත හොඳින් ප්‍රචාරය කරන්න. නැති නම් දැන්වීම් පුවරුවේ විශාල කර ප්‍රදර්ශනය කරන්න.

**පහත සඳහන් ආකාරයට සැසි වාර පැවැත්වීමට නියමිත ව ඇත.**

**1 වන අදියර : ශුද්ධ බයිබලය කියවීම පුහුණු කොට, ඒ සඳහා සුදුසුකම් ලබන්නන් හට බලපත්‍ර ලබා දීමේ සැසි වාරය**

**2 වන අදියර : 1 වන අදියරයට සහභාගි වී බලපත්‍ර ලබන්නට සුදුසුකම් ලැබූවන් සඳහා ය.**

**ශුද්ධ බයිබලය පටිගත කිරීමේ දී කට හඬ දායක්වය සඳහා පවත්වන සැසි වාරය (Audio recording).**

<u>**ඒ පිළිබඳ විස්තර මෙසේ ය:**</u>

1) සිංහල, දෙමළ, හා ඉංග්‍රීසි භාෂාවන් සඳහා වෙන් වශයෙන් සැසි වාර පැවැත්වේ.

2) ආරම්භක සැසි වාර සිංහල භෂා මාධ්‍යයෙන් පැවැත්වේ.

2) එක් සැසි වාරයක පුහුණු කාලය මාස හයකි.

3) එක් සැසි වාරයක් සඳහා බඳවා ගනු ලබන්නේ, 20 - 24 දක්වා ඉල්ලුම් කරුවන් සංඛ්‍යාවකි.

4) මේ සඳහා ඇති වන අවශ්‍යතාව අනුව සැසි වාර ගණන තීරණය වනු ඇත.

5) වයස, අවුරුදු දොළහට වැඩි අයට පමණක් මෙයට සහභාගි විය හැක.

6) සෑම මසක ම එක් සෙනසුරාදාවක පෙ. ව. 9.00 - 11.30 දක්වා සැසි වාර පවත්වනු ලැබේ.

7) සහභාගි වන්නන් විසින් රු.2,000.00 ක සේවා ගාස්තුවක් දැරිය යුතු ය.

8) මුද්‍රිත ලේඛන, ලිපි ද්‍රව්‍ය හා මුද්‍රිත සටහන් ඔබට සපයනු ඇත.

9) බලපත්‍රය හිමිකර ගැනීම සඳහා සෑම සැසි වාරයකට ම සහභාගි විය යුතු ය.

ආරම්භක සැසි වාරය 2018 ජුලි මස 21 වන සෙනසුරාද පැවැත්වේ.

**ස්ථානය**: ශ්‍රී ලංකා බයිබල් සංගමය, 293, ගාලු පාර, කොළඹ- 03.

මේ සඳහා අප විසින් ඔබට එවන ඉල්ලුම් පත්‍රය පුරවා, ජුලි මස 14 වන දිනට පෙර අප වෙත ලැබෙන්න සලස්වන්න.

සම්පත් දායකත්වය : **ශිවන්ත අර්ථසාද් සහෝදරයා**

මෙයට විශ්වාසී

---------------------------------------

මහ ලේකම්තුමා
ගරු ප්‍රියන්ත විජේගුණවර්ධන දේවගැති තුමා
ශ්‍රී ලංකා බයිබල් සංගමය

**සියලු විමසීම් : විලක්ෂිත මෙන්ඩිස් මහතා, දුර කථන:**

**ජංගම: 0777568384**

**කාර්යාල : 011 2565583/4- ක්ෂණික ඇමතුම්: 110**

විද්‍යුත් තැපෑල (E- Mail) : wilakshitha@ceylonbiblesociety.org

කාර්යාල : විද්‍යුත් තැපෑල (E- Mail) : info@ceylonbiblesociety.org

අපගේ වෙබ් අඩවියට පිවිසීමෙන් ද ඔබට අයැදුම් පත් ලබා ගැනීමට හැකි ය.
www.ceylonbiblesociety.org